**ශීර්ෂය - 332 ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදි වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක එස්ජ්/එම්ජ්ජ්/02/01/01 දරන හා 2022 ජනවාරි 12 දිනැති ලිපිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල "වාර්තා කිරීමේ පදනම" සංශෝධනය කර තිබුණ ද, දෙපාර්තමේනතුව විසින් පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශන වලින් එය හෙළිදරව් නොකර ඉකුත් වර්ෂයේ සංඛ්‍යා සංශෝධනය පමණක් සිදුකර තිබුණි.

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (අ) ඡේදයේ සඳහන් නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශනයන්හි මා විසින් කර තිබූ නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයන් අනුව (එස්ඒ 82 ආකෘතිය) අනුව රු. 37,967,000 ක් වටිනා ප්‍රවාහන උපකරණ දෙපාර්තමේන්තුව සතුව පවතින බව දක්වා තිබුණ ද, රු. 12,900,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 05 ක් ද ඒ තුළ ඇතුළත් බව දෙපාර්තමේන්තු පොත් හා ස්ථාවර වත්කම් ලේඛනය පරීක්ෂාවේ දී විගණනයට නිරීක්ෂණය විය. මේ හේතුවෙන් දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් ස්ථාවර වත්කම් වටිනාකමේ නිරවද්‍යතාවය පිළිබඳව විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | මෙම වාහන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම් කටයුතු සිදු කරමින් පවතියි. | දෙපාර්තමේන්තු ස්ථාවර වත්කම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන හා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළයුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරනු ලැබූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ වූ දේපල පිරියත හා උපකරණ වටිනාකම රු. 73,560,677 ක් වුව ද, භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශයන් (එස්ඒ 82) අනුව 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.72,077,297 ක් වූයෙන් රු. 1,483,380 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2022 මාර්තු මාසයේ ගිණුම් සාරාංශයෙන් නිවැරදි වී ඇත. | දේපල පිරියත උපකරණ මුළු වටිනාකම එස්ඒ 82 ආකෘතියේ දැක්විය යුතු වීම. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වාගෙන යාම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණ වල දී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වාහන ලේඛනය | | |
| | මුදල් රෙගුලාසි 1646 (ඉ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් එම වාහනවල විස්තර ඇතුලත් කර වාහන ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මේ වන විට වාහන ලේඛනය සකස් කර පවත්වා ගෙන යනු ලැබේ. | මු.රෙ.1646 (ඉ) හි සඳහන් තොරතුරු ඇතුළත් වාහන ලේඛනයක් පවත්වා ගතයුතු වීම. |

(ආ) වාහන ලොග්පොත්

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි. 1645 (ආ) ප්‍රකාරව වාහන ලොග්පොත් නඩත්තු කර තිබුණ ද ඒවා යාවත්කාලීන කර නොතිබුණි. | ලොග් පොත් අඩුපාඩු නිවැරදි කොට යාවත්කාලීන කිරීමට කටයුතු කර ඇත. | වාහන ලොග් පොත් ක්‍රමානුකූලව නඩත්තු කළයුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ මූලධන වියදම් සඳහා ලද ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 2,713 ක් වුව ද ශුද්ධ වියදම රු. මිලියන 975.4 වූයෙන් ඉතිරිය රු. මිලියන 1737.6 ක් වී තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයට ඉතිරිය සියයට 64 ක් විය. | අක්මුදල් ප්‍රමාණවත් පරිදි නොලැබීම, පැවති කොරෝනා වසංගතය හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාධා ඇතිවීම හා කාර්යාලය වසා තැබීම මේ සඳහා හේතුවිය. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළයුතු වීම. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) වැය විෂයය සංකේත අංක 332-1-01-1703 යටතේ ලද රු. 75,000 ක ශුද්ධ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | පැවති කොරෝනා වසංගතය හේතුවෙන් පුහුණු වැඩ සටහන් නොපැවැත්වීම මෙයට හේතු විය. | මු.රෙ.50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළ යුතු වීම. |
| (ආ) පුනරාවර්තන වැය විෂයය තුනක් සඳහා ලද රු. මිලියන 13.88 ක ප්‍රතිපාදනයෙන් සියයට 18 සිට සියයට 47 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට බිල්පත් ඉදිරිපත් නොවීම, කොරෝනා වසංගතය හේතුවෙන් කාර්යාලය වසා තැබීම නිසා මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | - එම - |
| (ඇ) මූලධන වැය විෂයය පහක් සඳහා ලද රු. මිලියන 2,708.15 ක ප්‍රතිපාදනයෙන් සියයට 44 සිට සියයට 91 දක්වා වූ පරාසයක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. | වියදම් සීමා කිරීම, ප්‍රමාණවත් අක්මුදල් නොලැබීම, කොරෝනා වසංගතය හා බිල්පත් ඉදිරිපත් නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. | - එම - |

**2.3 අවිධිමත් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 137(2) සහ (3) හි සඳහන් විධිවිධානයන් හා 138(4) සහ (8) හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස ගම්පහ දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබූ අසුපිනි ප්‍රජා ජල ව්‍යාපෘතියේ කාර්යයන් 16 ක් ලංසු ලේඛනයන්හි ඇතුළත් කොන්දේසි සහ නියමයන්ට පටහැනිව ඉදිකිරීම් සිදු කර තිබිය දී රු. 904,470 ක් ප්‍රජා මූල සංවිධානයට ගෙවා තිබුණි. | පරීක්ෂණයක් සිදුකර පිළිතුරු ලබාදීමට කටයුතු කරමි. | කොන්ත්‍රාත්වලට අදාල ලංසු ලේඛනයන්හි ඇතුළත් කොන්දේසි හා නියමයන්ට සහ මුදල් රෙගුලාසි සංග්‍රහයේ ප්‍රතිපාදනයන්ට අනුව කටයුතු කළ යුතු වීම. |

**2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 උප වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වාර්ෂික කාර්යසාධන වාර්තා කෙටුම්පත් සකස්කර අවසන් කර ඇත. | ජාතික විගණන පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | **ශ්‍රී ලංකාවේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 570 | වර්ෂ දෙක ඉක්මවූ පොදු තැන්පත් ගිණුම් වලට අදාල එකතුව රු.29,975,174 ක් වූ තැන්පතු 471 ක් වසර දෙකට වඩා වැඩි නමුත් රාජ්‍ය අදායමට බැර කිරීමට පියවර ගෙන නොතිබුණි. | පෙර වර්ෂවල රඳවාගත් මුදල්වලින් ඉල්ලුම් නොකරන ලද වර්ෂ දෙක ඉක්ම වූ මුදල් හා ව්‍යාපෘතිවලින් ඉතිරි වූ මුදල් 2022 වර්ෂයේ දී රජයේ ආදායමට බැර කරන ලදී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පතු රජයේ ආදායමට බැර කළ යුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 104(3) හා 104(4) | අනුරාධපුර වැඩභාර නිලධාරී කාර්යාලයේ 2018 නොවැම්බර් 10 දින සිදු වූ රිය අනතුර සම්බන්ධයෙන් අලාභ හානි නිශ්චය කොට අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම 2022 අප්‍රේල් 20 දින වන විටත් සිදු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරමින් පවති. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (iii) | මුදල් රෙගුලාසි 109 | නුවරඑළිය වැඩ භාර නිලධාරී කාර්යාලයේ 2018 වර්ෂයේ සිදු වූ පරිගණක උපාංග නැතිවීම සම්බන්ධයෙන් වූ අලාභය පොත්වලින් කපාහැරීම 2022 මාර්තු 31 දින තෙක් සිදුකර නොතිබුණි. | කපාහැරීමට ප්‍රතිපාදන ලද පසු ඉදිරි කටයුතු කරමි. | - එම - |
| (iv) | මුදල් රෙගුලාසි 133 | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | නිලධාරියෙකු පත්වුණ වහාම අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවීමට කටයුතු කරනු ලැබේ. | - එම - |
| (v) | මුදල් රෙගුලාසි 394(ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට මාස 06 කට වැඩි කාලයක් මුදල් කරගෙන නොතිබූ රු.102,815 ක් වටිනා චෙක්පත් දහයක් අවලංගු කිරීම හෝ ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම සිදුකර නොතිබුණි. | මේ වන විට මෙම චෙක්පත් සියල්ල ගෙවීමට ඉදිරිපත් කර ඇත. | - එම - |
| (vi) | මුදල් රෙගුලාසි 137(8) | දනවල පානීය ජල සැපයුම් යෝජනා ක්‍රමයේ රළු වැලි පෙරහන් ටැංකිය ඉදිකිරීම වෙනුවෙන් දනවල නිතියාවල සිංහ ගොවි සංවිධානයට අවසන් බිල්පත සඳහා 2019 දෙසැම්බර් 31 වන දින සම්පූර්ණ මුදල් ගෙවීම් කර තිබුණ ද එම කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ආරම්භයේ දී ගෙවන ලද රු. 176,723 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 15 වන විටත් අයකරගෙන නොතිබුණි. | 2022 දෙසැම්බර් 27 දින රු. 176,723 ක මුදල දෙපාර්තමේන්තු ගිණුමට බැර කර ඇත. | - එම - |

(ඇ) **රාජ්‍ය මුදල් චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.2 ඡේදය | 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව තුළ ඇතුළත් 47 වාර්තාව අනුව විනාශ කළ යුතු හෝ අලුත්වැඩියා කළ යුතු ලෙස හඳුනාගත් මාතලේ, කොළඹ, පුත්තලම, මාතර හා ගම්පහ යන දිස්ත්‍රික්කයන්හි භාණ්ඩ සම්බන්ධයෙන් 2022 මාර්තු 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ලද පසුව එය අවසන් කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ | | . | |
| | - 3.1 ඡේදය | දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා මූල සංවිධාන වෙත ඉදි කිරීම් වැඩ කොන්ත්‍රාත් පවරා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ සිට ව්‍යාපෘතීන්ගෙන් ප්‍රතිලාභ ලබන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි ප්‍රජා මූල සංවිධානය වෙත කොන්ත්‍රාත් පවරා ඇති අතර බහුතර ව්‍යාපෘති ප්‍රමාණයක් තරගකාරී මිල ක්‍රමය යටතේ ලබා දී ඇත | - එම - |
| | -3.2 (iv) ඡේදය | ප්‍රසම්පාදන කාර්යයන් පිරිනැමීමෙන් පසුව අදාල ප්‍රජා මූල සංවිධාන විසින් වැඩ විෂයයන්උප කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. | ප්‍රජා මූල සංවිධානය වෙත ලබාදෙන ඉදිකිරීම් ඒ සම්බන්ධ විෂය දැනුම ඇති කාර්මිකයන් ලවා සිදුකරගෙන ඇත. | - එම - |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

| | | | | |
|---|---|---|---|---|
| (i) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.5 ඡේදය | සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් දෙපාර්තමේන්තුව සඳහා මානව සම්පත් සැලැස්මක් සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2021/2022 වර්ෂ සඳහා මානව සම්පත් සැලැස්මක් මේ වන විට සකස් කර ඇත. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) අංක 30/2016 දරන හා 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සෑම ඉන්ධන පරීක්ෂාවකින් මාස 12 ක කාල සීමාවකට පසුව හෝ කිලෝ මීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව යන කාරණා අතුරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව සතු වාහනවලට අදාලව එසේ ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබූ බව එම වාහන වලට අදාල ලොග් පොත් පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | ඉන්ධන දහන පරීක්ෂාවන් කඩිනමින් සිදුකර දෙන ලෙස ස්ථාන භාර නිලධාරින් හට උපදෙස් ලබා දී ඇත. | - එම - |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුව පිහිටුවා වසර හයකට ආසන්න කාලයක් ගත වුව ද දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාල පනතක් සම්මත කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කළමනාකාරීත්වය අපොහොසත්ව පැවතුණි. ඒ හේතුවෙන් දෙපාර්තමේන්තුවේ නෛතික වලංගුතාවය මෙන්ම ඒ යටතේ ලියාපදිංචි කොට ඇති ප්‍රජා මූල සංවිධාන පාලනය කිරීමට ඇති අධිකාරී බලය සම්බන්ධයෙන් විගණනයේ දී ගැටළුකාරී වේ. | පිළිතුරු ලබා දී නැත. | දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාල පනත සම්මත කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

## 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජ්‍ය අමාත්‍යාංශ ප්‍රතිපාදන මත දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කළ නැනෝ ජල පිරිපහදු පද්ධති ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී පුත්තලම දිස්ත්‍රික්කය සඳහා රු. මිලියන 49.5 ක පිරිවැයක් දරා තිබූ අතර ඒ වෙනුවෙන් වූ ඇස්තමේන්තු ප්‍රකාරව සියළු ගෙවීම් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, එකී නැනෝ පිරිපහදු පද්ධති සඳහා විදුලි සැපයුම ලබා ගැනීමට අපොහොසත්ව තිබූ හෙයින් 2022 වර්ෂයේ ජනවාරි අවසානය වන විටත් ඉන් අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට අපොහොසත්ව පැවතුණි. | මෙහි කටයුතු කඩිනම් කරන ලෙස විදුලිබල මණ්ඩලය දැනුවත් කළ ද අවශ්‍ය උපාංග හිඟයක් පවතින බව දැනුම් දී ඇත. මේවන විට මෙම යන්ත්‍ර 30 සඳහා විදුලි බලය ලබා දී ඇත. | ව්‍යාපෘතීන්ගෙන් අපේක්ෂිත ප්‍රතිලාභ අදාල කාලය තුළ ලබා ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

## 3.3 ව්‍යාපෘති නිම නොකර අත හැරීම

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති දිස්ත්‍රික්ක 23 කට අයත් ප්‍රජා මූල සංවිධානයන්හි ජල ව්‍යාපෘති 311 ක් 2000 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වූ කාල පරාසයක අක්‍රීයව පැවතුණි. කෙසේ වෙතත්, මේ අතුරින් මඩකලපුව, නුවරඑළිය, බදුල්ල, පුත්තලම, මොණරාගල හා කොළඹ යනාදී දිස්ත්‍රික්ක තුළ මේ වන විට අක්‍රීයව පවතින ව්‍යාපෘති නැවත සක්‍රීය තත්ත්වයට පත්කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | දශක 04 ක් පුරාවට මෙලෙස අක්‍රීයභාවයට පැමිණුන ව්‍යාපෘති රාශියක් ඇති බැවින් එක් වර්ෂයක දී එම සියළු ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කළ නොහැක. | අක්‍රීය තත්ත්වයේ පවතින නැවත සක්‍රීය තත්ත්වයට පත් කළ හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) | කිලිනොච්චිය, කෑගල්ල, ගාල්ල, වව්නියාව හා මොණරාගල යන දිස්ත්‍රික්කයන්හි ප්‍රජා මූල සංවිධානයන්ට අයත් ව්‍යාපෘතීන් විදුලි බිල නොගෙවීම, ජල මීටර් අක්‍රීය වීම හා නිසි කළමනාකරණයක් නොමැතිවීම වැනි හේතූන් නිසා අක්‍රීයව පවතින බව නිරීක්ෂණය වුව ද, ඒවා නැවත සක්‍රීය කොට ජනතා අයිතියට පත්කිරීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | - එම - | - එම - |

## 3.4 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන ජල ව්‍යාපෘති 275 කින් ව්‍යාපෘති 105 ක ප්‍රගතිය 2021 දෙසැම්බර් 31 දිනට සියයට 50 කට වඩා පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. | අක්මුදල් නිසි වේලාවට නොලැබීම, කොරෝනා වසංගතය හේතුවෙන් ක්ෂේත්‍රයට යාමට නොහැකි වීම, ව්‍යාපෘති සඳහා වාර ගණනාවක් නැවත නැවත ටෙන්ඩර් කැඳවීම, ඉදිකිරීම් ද්‍රව්‍ය මිල ඉහළ යාම ආදිය හේතුවෙන් ව්‍යාපෘති ඉටුකිරීම ප්‍රමාද විය. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) | ජාතික ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂය තුළ ආරම්භ කොට එම වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කොට තිබූ පිරිවැය රු. මිලියන 603.15 ක් වූ ව්‍යාපෘති 81 කින් රු. මිලියන 591.96 ක් වූ ජල ව්‍යාපෘති 76 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම නොකොට පැවති අතර මඩකලපුව, මුලතිව්, කුරුණෑගල, නුවර සහ බදුල්ල යන දිස්ත්‍රික්කයන්හි එකතු වටිනාකම රු. මිලියන 43.15 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කොට තිබූ ජල ව්‍යාපෘති 06 ක භෞතික ප්‍රගතිය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සියයට 20 සිට සියයට 30 දක්වා වූ ඉතා පහළ පරාසයක පැවතුණි. ඊට අමතරව ඉහත ව්‍යාපෘතිය යටතේ 2019 වර්ෂය තුළ ගාල්ල සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කයන්හි ආරම්භ කොට එම වර්ෂය තුළ නිමකිරීමට අපේක්ෂාකර ජල සැපයුම් ව්‍යාපෘති පහක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කිරීමට අපොහොසත්ව පැවතුණි. | ඉහත (අ) හි සඳහන් හේතුන් නිසා ව්‍යාපෘති ඉටු කිරීම ප්‍රමාද වූ අතර තිසෝගම පුබුදු ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ පවුල් 300 කට ද, ඇල්පිටිය ගුලන්කන්ද ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් 30 ක් සඳහා ද නාගොඩ, කැප්පෙටියාගොඩ ගිං සොබා ව්‍යාපෘතිය යටතේ ජල සම්බන්ධතා 82 ක් ලබා දී ඇත. තවලම, ගල්ලන්දර ව්‍යාපෘතියේ නල එළීමේ දී මතු වූ ප්‍රායෝගික ගැටළුවක් මත සීමිත දුර ප්‍රමාණයක නල එළීම් සිදු කොට ඇත. | - එම - |
| (ඇ) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කොට තිබූ හා වර්ෂය අවසාන වීමට පෙර නිම කිරීමට සැලසුම්කර තිබූ ජලයේ ගුණත්වය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාත්මක කළ පිරිවැය රු.මිලියන 101 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ආරම්භ කර තිබූ ව්‍යාපෘති 21 කින් පිරිවැය රු.මිලියන 72.7 ක් වූ ගම්පහ, පුත්තලම, කළුතර, හම්බන්තොට සහ මාතර යන දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරී වසම් 16 ක් ආවරණය කරමින් ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘතීන් 16 ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් නිමකර නොතිබුණි. තව ද, ඉන් හම්බන්තොට සහ මාතර දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක | ව්‍යාපෘති 21 න් ව්‍යාපෘති 18 ක වැඩ අවසන් කර ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| | කර තිබූ ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 16 ක් වන ව්‍යාපෘති 04 ක භෞතික ප්‍රගතිය සියයට 20 සිට සියයට 30 දක්වා වූ පහළ පරාසයක පැවති බව නිරීක්ෂණය විය. | | |
| (ඇ) | ග්‍රාමීය හා ප්‍රාදේශීය ජල සම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මගින් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කොට තිබූ ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ වූ රු.මිලියන 286.95 ක ව්‍යාපෘතීන් 08 කින් රු.මිලියන 120.4 ක ව්‍යාපෘතීන් 05 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම කර නොතිබුණි. තව ද, උක්ත ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීමේ අරමුණින් එම ජල මූලාශ්‍ර ආශ්‍රිතව ජීවත් වන පවුල් සඳහා සනීපාරක්ෂක වැසිකිළි ලබා දීමේ වැඩසටහන සමාලෝචිත වර්ෂය අවසානය වන වට නිම කළ යුතුව පැවතුණ ද විගණනයේ නියැදි පරීක්ෂාවට ලක්වූ කළුතර දිස්ත්‍රික්කයේ වලල්ලාවිට, බුලත්සිංහල සහ පාලින්දනුවර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ කොට නොතිබුණි. | කළුතර දිස්ත්‍රික්කයේ එක් ව්‍යාපෘතියක 80% පමණ වැඩ නිමකර යන විට ඉඩම් ගැටළුවක් මතුවීම මත ප්‍රමාද විය. | - එම - |

### 3.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ ව්‍යාපෘති 09 කට අදාලව ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් රු. 2,577,811 ක මුදලක් 2020 සහ 2021 වර්ෂය තුළ දී ප්‍රජා මූල සංවිධානයන්ට ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. | තිසෝගම පුබුදු ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘතියේ සහ අලකොලදෙනිය මල්ගල ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘතියේ අදාල කාර්යයන් නිම කර ඇත. සුදුකන්ද ජල සැපයුම් ව්‍යාපෘතියේ අඩුපාඩු නිවැරදි කර ඇත. කොස්හේන ජල සැපයුම් ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුද්‍රණය කිරීමේ දී සිදු වූ මුද්‍රණ දෝෂයක් වන අතර අසුපිනි ප්‍රජා ජල යෝජනා ක්‍රමය, මාවතගම ගල්ගොඩේවත්ත රන්දිය ප්‍රජා ජල යෝජනා ක්‍රමය, තවලම ගල්ලන්දර පානීය ජල යෝජනා ක්‍රමය, ඇල්පිටිය ගුලන්කන්ද ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘතිය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා වාර්තා කිරීමට කටයුතු කරමි. | බිල්පත් අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම් කිරීම යන කාර්යයන්හි දී මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 3.6 වාර්ෂික කාර්ය සාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය අනුව වාර්ෂික කාර්යය සාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණ ද එසේ සිදු කොට නොතිබුණු අතර 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2015 සිට 2018 වර්ෂයන් සඳහා වූ වාර්ෂික කාර්යසාධන වාර්තා 2022 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේනතුවේ සභාගත කර නොතිබුණි. | 2019, 2020 වර්ෂවල කාර්යසාධන වාර්තා 2022 මාර්තු 08 දින භාර දී ඇති අතර, 2021 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව කෙටුම්පත් කර ඇත. 2015 සිට 2018 වර්ෂයන් සඳහා කාර්යසාධන වාර්තා සකස්කර ඇති අතර, සභාගත කර නැත. | රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතු අතර රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වීම. |

### 3.7 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කුරුණෑගල, ගාල්ල, කළුතර, මහනුවර සහ මාතර යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා ජල පොම්ප හා උපාංග මිල දී ගැනීමට සුදුසු ආයතන තෝරාගැනීම වෙනුවෙන් 2019 අගෝස්තු 29 දින දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි සැපයුම්කරුවන් 7 දෙනෙකු හට මිල ගණන් කැඳවීම් ලිපි යවා තිබූ අතර ලංසු විවෘත කරන දින වන විට ආයතන පහකින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම ප්‍රසම්පාදනය සඳහා අදාල පොම්ප පිරිවිතරයන් දෙපාර්තමේන්තුව විසින් කලින් පිළියෙල කර නොතිබුණි. | පොම්ප පිරිවිතරයන් කලින් පිළියෙල කර තිබේ. | ප්‍රසම්පාදනයන්ට අදාල පිරිවිතර කලින් පිළියෙල කළ යුතු වීම. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1. (ඇ) වගන්තිය අනුව පළමු රැස්වීමේදී ප්‍රසම්පාදනය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පල කිරීම, ලංසු කැඳවීමේ ලේඛන විකිණීම, ලංසු කැඳවීම අවසන් කිරීම හා විවෘත කිරීම සහ එහි (ඈ) වගන්තිය අනුව ලංසු ලේඛන හා භාවිතා කල යුතු කොන්ත්‍රාත් ලේඛන වල වර්ගය සහ ස්වභාවය පිළිබඳ තාක්ෂණ ඇගයීම් කමිටුව සමඟ එකඟවිය යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර ඉහත දිස්ත්‍රික්කයන් සඳහා පොම්ප මිල දී ගැනීමේ දී එකවර මිල ගණන් | අවශ්‍යතාවයන් අනුව වරින්වර ප්‍රසම්පාදන කටයුතු සිදුකරන ලදී. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කැඳවීමකින් තොරව වරින් වර මිල ගණන් කැඳවා ප්‍රසම්පාදනය සිදුකර තිබුණි. | | |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 6.3.3 වගන්තිය ප්‍රකාරව ලංසු විවෘත කිරීමේ කමිටුව, ප්‍රසම්පාදන කමිටුව විසින් නම්කරනු ලබන නිලධාරීන්ගෙන් සමන් විය යුතු වුවත් උක්ත ප්‍රසම්පාදනය සඳහා වූ ලංසු විවෘත කිරීමේ කමිටුව, ලංසු විවෘත කළ දිනයේ දී ම ප්‍රසම්පාදන අධ්‍යක්ෂ විසින් පත්කර තිබුණි. | ප්‍රසම්පාදන කමිටුව විසින් නම්කළ ලංසු විවෘත කිරීමේ කමිටුව, ප්‍රසම්පාදන අධ්‍යක්ෂ ප්‍රසම්පාදන කමිටුවේ බලයලත් නිලධාරියා ලෙස අදාල නිලධාරීන්ට දන්වා ඇත. | - එම - |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1(අ) වගන්තිය අනුව සියළු වියදම් ඇතුළු පිරිවැය ඇස්තමේන්තු ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් නිසි ලෙස සැකසිය යුතු වුවත් පොම්ප හා උපාංග මිල දී ගැනීම සඳහා අසාමාන්‍ය ලෙස අඩු මිල ගණන් ඇතුළත්කර අදාල නිලධාරීන් විසින් ඇස්තමේන්තු සකස්කර ඇති බව මහනුවර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සඳහා ජල පොම්ප හා උපාංග මිලදී ගැනීමට අදාලව පිළියෙල කර තිබූ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවට අනුව නිරීක්ෂණය වූ අතර එම කමිටු වාර්තාවට අනුව ඉංජිනේරු ඇස්තමේන්තුව හා ලංසු මිල ගණන් අතර විචලනය සියයට 18 සිට සියයට 695 දක්වා වැනි ඉහළ පරාසයක් ගෙන තිබුණි. | අප විසින් සකස්කරන ඇස්තමේන්තුවලට වර්ගය හා මාදිලිය ඇතුළත් නොකරන අතර ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන වර්ගය හා මාදිලිය අනුව මිල ගණන් වෙනස්විය හැකිය. | - එම - |
| (ඉ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 (අ) වගන්තිය අනුව ඉටු කළ වැඩ සඳහා පිරිවිතර සහ එකඟ වී ඇති වෙනත් නියම සහ කොන්දේසි වලට අනුකූලව වැඩ ඉටුකර ඇති බවත් සහතික කර ඇති ගෙවීම් කොන්ත්‍රාත්තුවේ කොන්දේසි වලට අනුකූලව සිදු කර ඇති බවත් සහතික කරමින් වැඩ අවසන් කළ පසු, වැඩ අවසන් කිරීමේ සහතිකයක් ඉංජිනේරුවරයා හෝ උපදේශකවරයා විසින් නිකුත් කළ යුතු වුව ද, විගණනය විසින් ගාල්ල, මාතර සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක වල ක්‍රියාත්මක කර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා සවි කර තිබූ පොම්ප 07 ක් ප්‍රසම්පාදන සම්බන්ධයෙන් සිදුකළ නියැදි භෞතික විගණන පරීක්ෂාවට අනුව එම පොම්පයන් ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබූ පිරිවිතරයන් සහිත පොම්ප නොවන බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත්, එම පොම්ප ඉල්ලුම් කරන ලද මාදිලියේ පොම්ප බවට නිර්දේශ කරමින් දිස්ත්‍රික් ඉංජිනේරුවරයා ඉදිරිපත් කර තිබූ බිල්පත් සඳහා සැපයුම්කරු විසින් ඉදිරිපත් කර තිබූ මිල ගණන් පදනම් කොට ගෙන ගෙවීම්කර තිබීම හේතුවෙන් නියැදි විගණන පරීක්ෂාවට ලක් වූ පොම්ප 04 ක් සම්බන්ධයෙන් පමණක් දෙපාර්තමේන්තුවට ආසන්න වශයෙන් රු. 1,109,750 ක මූල්‍යමය අලාභයක් සිදුව තිබුණි. | විදුලි සැපයුම් ගැටළු සහ ප්‍රජා මූල සංවිධානවල ඉල්ලීම හේතුකොටගෙන පොම්ප මාදිලිය වෙනස් කර තිබූ අතර අමතර මුදලක් අය නොකර එම කාර්යය නිම කර ඇත. එම වැඩබිම් වල සවිකර ඇති පොම්ප හා උපාංගවල මිල ගණන් අප විසින් කොන්ත්‍රාත් ප්‍රදානය කළ මුදලට සමාන හෝ වැඩි බව පෙනේ. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තිය ප්‍රකාරව අවම පිරිවැයක් මත උපරිම වාසි ලබාගත හැකි වන සේ ප්‍රසම්පාදන කටයුතු මගින් මිලදී ගැනීම් සිදුකළ යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු වාහන 06 ක් සඳහා රු. 745,700 ක් වටිනා ටයර් 25 ක් 2021 පෙබරවාරි සිට 2021 ඔක්තෝබර් දක්වා අවස්ථා 06 ක දී මිල දී ගෙන තිබූ අතර, මේ සඳහා එකවර මිල ගණන් කැඳවා මිල දී ගැනීමෙන් තොරව වරින් වර ආයතනවලින් මිල ගණන් ලබා ගැනීමෙන් මිල දී ගැනීම සිදු කර තිබුණි. ඒ අනුව එම මිල ගණන් අතර රු. 23,280 සිට රු. 43,020 දක්වා වන ඉහළ පරාසයක මිල විචලනයන් සිදුව තිබූ බව විගණනයේ දී නිරීක්ෂණය විය. | එකවර විශාල ඉඩ ප්‍රමාණයක් අවශ්‍ය වන බැවින් ටයර් වැනි වාහනවලට අවශ්‍ය උපකරණ ගබඩාකර ගැනීමේ ගැටළුවක් පවතී. එබැවින් එකවර මිල ගණන් කැඳවා මිල දී ගැනීම අපහසු වී ඇත. | - එම - |
| (උ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 වගන්තිය හා ප්‍රජා ජල අභිමානී ව්‍යාපෘති සඳහා දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබූ මාර්ගෝපදේශයේ විධි විධාන ප්‍රකාරව ප්‍රසම්පාදනයක් සිදු කිරීමට පෙර අස්ථිත්වය විසින් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ උපයෝගිතා හා නැවත ස්ථානගත කර ගැනීමේ කටයුතු වන්දි සහ නැවත පදිංචි කිරීමේ ප්‍රශ්න විසඳා ඇති බව, ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියළු කරුණු ඉටුකර ඇති බව සනාථ කළ යුතු වුව ද, නියැදි විගණන පරීක්ෂාවට ලක් වූ තිසෝගම පුබුදු ප්‍රජා ජල සැපයුම් ව්‍යාපෘතියේ සහ සුහද ප්‍රජා ජල යෝජනා ක්‍රමයේ ළිඳ, පොම්පාගාරය සහ ජල ටැංකි ඉදිකොට ඇති ඉඩම් පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. | නීත්‍යානුකූලව ප්‍රජා මූල සංවිධානය වෙත පවරාගැනීමට බිංගිරිය ප්‍රාදේශීය ලේකම් වෙත යවා ඇත. නෛතික අයිතිය පවරාගැනීමෙන් පසුව පමණක් ජල ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම ප්‍රායෝගිකව සිදුකළ නොහැක. | - එම - |

**3.8 වත්කම් කළමනාකරණය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ----------- |
| (අ) | දෙපාර්තමේන්තුව සතු මෝටර් රථ 02 ක් ධාවන තත්ත්වයේ පවතින නමුත් එම වාහන අලුත් වැඩියා කිරීමට කටයුතු කිරීමෙන් තොරව දිගු කාලයක් දෙපාර්තමේන්තු භූමියේ ගාල් කර ඇති බව නිරීක්ෂණය විය. | GX - 4232 වාහනය සඳහා ප්‍රතිපාදන නොමැතිවීම මත අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති අතර 57 - 0016 වාහනය අපහරණය කිරීමට නියමිතය. | ධාවන තත්ත්වයේ පවතින වාහන ධාවනයට යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ධාවනය සඳහා යොදවා ඇති ප්‍රධාන කාර්යාලයේ සංචිත වාහන 02 ක් හා අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලයේ එක් වාහනයක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රියදුරන් අනුයුක්ත කර නොතිබුණි. | රියදුරු තනතුරු 23 ක් පුරප්පාඩුව පවතින අතර ගාල්ල හා මාතර දිස්ත්‍රික්ක සඳහා මේ වන විට රියදුරන් අනුයුක්ත කර ඇත. | සියළුම වාහන උපයෝජනය කළහැකි වන පරිදි ප්‍රමාණවත් රියදුරන් අනුයුක්ත කළ යුතු වීම. |
| (ඇ) | 2021 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසයන්හි දී දෙපාර්තමේන්තු රාජකාරී කටයුතු සඳහා කුලී වාහන 04 ක් භාවිතා කර තිබූ අතර දෙපාර්තමේන්තුව සතු වාහන එම කාලච්ඡේදය තුළ දී ධාවන කටයුතු සඳහා අවම වශයෙන් භාවිතා කර තිබුණි. එසේ ධාවනයට යොදාගත් කුලී වාහන වෙනුවෙන් ඔක්තෝබර් සහ නොවැම්බර් මාසයන්හි දී පිළිවෙලින් රු. 837,890 ක් හා රු. 901,020 ක් දරා තිබුණි. | සංචිත වාහන දෙක භාවිතා කිරීම සඳහා රියදුරු තනතුරු පුරප්පාඩුව පවතින බැවින් ඒවා ධාවන කටයුතු සඳහා භාවිතා නොවීය. | ධාවන තත්ත්වයේ පවතින වාහන ධාවනයට යොදා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ ව්‍යාපෘති හයක් සඳහා මිල දීගෙන තිබූ රු. 11,115,690 ක් වටිනා පොම්ප හා උපාංග අදාල කාර්යයන් සඳහා යොදා නොගෙන සමාලෝචිත වර්ෂය අවසානයටත් නිෂ්කාර්යයව පැවතුණි. | ව්‍යාපෘති 03 ක් සඳහා මිල දී ගෙන තිබූ පොම්ප මේ වන විට සවි කර ඇත. දනවල පානීය ජල සැපයුම් ව්‍යාපෘතියේ සහ නාගොඩ, කැප්පෙටියාගොඩ ජල ව්‍යාපෘතියේ ජල මනු සවිකිරීම ප්‍රමාද වී ඇත. අසුපිනි ජල ව්‍යාපෘතියේ නල එලීම් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ අනුමැතිය ලැබී නැත. | නිශ්කාර්ය වත්කම් අදාල කාර්යය සඳහා කඩිනමින් උපයෝජනය කළ යුතු වීම. |

**3.9 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ධාවන කටයුතු සඳහා භාවිතා නොකරන අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින හා අපහරණය කිරීමට නියමිත මෝටර් රථ 04 ක් සඳහා 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා රක්ෂණ ගාස්තු ලෙස රු. 263, 228 ක් දරා තිබූ බව නිරීක්ෂණය විය. | එම වාහන මාර්ගය ආසන්නයේ නතරකර ඇති බැවින් ඒවායේ ආරක්ෂාව සහ වටිනාකම සලකා බලා රක්ෂණය කර ඇත. | ධවනයට යොදා නොගන්නා වාහන අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.10 කළමනාකරණ දුර්වලතා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් සිදුකෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගාල්ල දිස්ත්‍රික්කයට අයත් ව්‍යාපෘතීන්හි ගංවතුර විපත් ප්‍රතිපූර්ණය සඳහා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ මිල දී ගෙන තිබූ රු. 711,760 ක් වටිනා පී.වී.සී. නල මීටර 5,230 ක් 2019 නොවැම්බර් 10 වන දින සැපයුම්කරු විසින් නිතියාවල පානීය ජල ව්‍යාපෘති සුහසාධන සමිතිය වෙත නීත්‍යානුකූල නොවන ලෙස ලබා දී තිබුණි. කෙසේ වෙතත්, ජල ව්‍යාපෘතියට අදාල ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවූ මෙම බට තොගය වසර 2 ½ කට අධික කාලයක් ප්‍රජා මූල සංවිධානය භාරයේ පැවතිය ද එය නැවත දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට අවශ්‍ය කිසිඳු ක්‍රියාමාර්ගයක් දෙපාර්තමේන්තුවේ ඉහළ කළමනාකාරීත්වය විසින් සමාලෝචිත වර්ෂය අවසානයටත් ගෙන නොතිබුණි. | එම බට තොගය සුදුසු සංවිධාන වෙත ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | රජයේ වියදමින් මිල දීගත් වත්කම් අවභාවිතය වැලැක්වීමට ක්‍රියාමාර්ග ගත යුතුවීම. |
| (ආ) | ගාල්ල දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක කර තිබූ ඇල්පිටිය ගුලන්කන්ද පානීය ජල ව්‍යාපෘතිය සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තු අවශ්‍යතාවයට වඩා සියයට 27 ක් ඉක්මවූ රු. 788,006 ක වටිනාකමකින් යුතු විවිධ පරිමාණයන් සහිත පී.වී.සී. නල සහ උපාංග ප්‍රජා මූල සංවිධානයට ලබා දී තිබුණ ද ඒවා නැවත දෙපාර්තමේන්තුව වෙත ලබා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගාල්ල දිස්ත්‍රික්කයේ අතිරික්තව පවතින ජල නල සුදුසු සංවිධාන වෙත ලබා දීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දී ඇත. | - එම - |
| (ඇ) | ප්‍රජාජල අභිමානී ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර තිබූ බද්දේගම කීඹියකන්ද ප්‍රජා ජල ව්‍යාපෘතිය, ගාල්ල ඇල්පිටිය අම්බන ප්‍රජා ජල ව්‍යාපෘතිය, නෙළුව නිතියාවල ප්‍රජා ජල ව්‍යාපෘතිය සහ ගල්ලන්දර සිසිල ප්‍රජා ජල ව්‍යාපෘතිය සඳහා නල එළීමේ කටයුතු වෙනුවෙන් අවශ්‍ය අනුමැතීන් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලබාගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අපොහොසත්ව පැවතුණි. | තවලම, ගල්ලන්දර ව්‍යාපෘතිය හැර අනෙකුත් ව්‍යාපෘතීන්හි නල එලීම් සිදුකර ඇත. | ව්‍යාපෘතීන් ආරම්භ කිරීමට පෙර ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අනුමැතීන් අදාල ආයතන වෙතින් ලබාගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ජාතික ප්‍රජා ජල අභිමානී වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කර තිබූ අසුපිනි ප්‍රජා ජල ව්‍යාපෘතිය යටතේ ඉදිකළ තුළුමුව ළිඳෙහි ප්‍රමාණවත් ජල ධාරිතාවයක් නොමැති වීම හේතුවෙන් මාඔය සිට තුළුමුව ළිඳ වෙත පොම්ප භාවිත කරමින් නීති විරෝධී ලෙස ජලය ලබා ගත්ත ද ඒ සඳහා අවශ්‍ය නීත්‍යානුකූල අනුමැතිය වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානයටත් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | ලිඛිත අවසරය ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් ස්ථානභාර නිලධාරී විසින් වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය ඉංජිනේරු වෙත ලිපියක් යොමු කර ඇත. | - එම - |
| (ඉ) | අංක 57 – 0015 දරන මෝටර් රථය අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පැවතීම හේතුවෙන් එය අපහරණය කිරීම සඳහා 2020 අගෝස්තු 28 දින මෝටර් රථ දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර තිබූ නමුත් 2021 නොවැම්බර් 30 දින තෙක් එම රථය අපහරණය කිරීමට කටයුතුකර නොතිබුණි. | කඩිනමින් අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. | අලුත්වැඩියා කළ නොහැකි වාහන අපහරණය කළ යුතු වීම. |
| (ඊ) | මාවතගම ගල්ගොඩෙවත්ත රන්දිය ප්‍රජා ජල යෝජනා ක්‍රමය යටතේ ඉදිකර තිබූ එක් නල ළිඳක ජලයේ බැක්ටීරියා අඩංගුවීම හේතුවෙන් පානය සඳහා නුසුදුසු බව 2019 නොවැම්බර් 20 දින ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කුරුණෑගල ප්‍රාදේශීය රසායනාගාරය විසින් නිකුත් කළ ජල තත්ත්ව වාර්තාවේ සඳහන් කර තිබූ අතර එය පානයට පෙර උණුකර නිවා ගැනීම හෝ ක්ලෝරිනීකරණය කළ යුතු බවට එහි නිර්දේශ කර තිබුණි. ව්‍යාපෘතියට අදාල ඇස්තමේන්තුව තුළ ක්ලෝරිනීකරණ ඒකකයක් ඉදිකිරීම සඳහා රු. 85,000 ක් වෙන් කර තිබුණ ද විගණිත දින වන විටත් එය ඉදිකොට නොතිබුණි. | තත්ත්ව පරීක්ෂණයෙන් අසමත් වූ නල ළිඳෙහි ජලය ටැංකිය වෙත පොම්ප කිරීම තාවකාලිකව නවතා ඇත. | ජනතාවට බෙදාහරිනු ලබන පානීය ජලයේ සුරක්ෂිතතාවය තහවුරු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (උ) ජල ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද ජල ගබඩා ටැංකි බාහිර පාර්ශවයන්ට ප්‍රවේශ විය නොහැකි පරිදි ආරක්ෂිත ආවරණයන් යොදා ආරක්ෂාව තහවුරු කිරීම සිදු කළ යුතු වුවත් බද්දේගම කිඹියකන්ද පානීය ජල ව්‍යාපෘතිය, ඉමදූව මයුර පානීය ජල ව්‍යාපෘතිය හා ඇල්පිටිය අම්බන පැහැසර පානීය ජල ව්‍යාපෘතිය යටතේ ඉදිකරන ලද ජල ගබඩා ටැංකි සඳහා සමාලෝචිත වර්ෂය අවසානයට එබඳු ආරක්ෂිත ආවරණයන් යොදා නොතිබුණි. | අදියර වශයෙන් ව්‍යාපෘතිවල කටයුතු නිම කිරීමට අපේක්ෂා කරමි. | - එම - |

**4.** **යහ පාලනය**

--------------

**අභ්‍යන්තර විගණනය**

------------------------

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත් 40 (1) වන වගන්තිය ප්‍රකාරව සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ රෙගුලාසි අංක 128(අ,ආ) සහ 133 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ රාජකාරි හා වගකීම ඉටුකිරීමේ දී ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවිය යුතු අතර, ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නිසි පරිදි පැවැත්විය යුතුය. කෙසේ වුව ද, දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුරක් අනුමත කර තිබුණ ද, එම තනතුරට අදාල බඳවාගැනීම් සිදුකර ගනිමින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය සහ ඵලදායීතාවය ඉහළ මට්ටමක පවත්වාගෙන යාම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කොට එය ක්‍රියාකාරී ලෙස පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | කැබිනට් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශයෙන් දෙපාර්තමේන්තුව විගණනයට ලක්කිරීමට අමාත්‍යාංශ ලේකම් වෙතින් අනුමැතිය ලබා ගැනීමට අදහස් කරමි. | ජාතික විගණන පනතේ සහ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු වීම. |

**5. මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සෑම සේවක කාණ්ඩයක් යටතේම අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සංඛ්‍යාවේ ප්‍රතිශතය සියයට 16 සිට සියයට 100 ක පරාසයක් ගන්නා බව නිරීක්ෂණය විය.එය අනුමත මුළු සේවක සංඛ්‍යාවෙන් සියයට 23 ක් තරම් ඉහළ අගයක් ගෙන තිබුණි. | පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය සේවා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට ලිපි යොමුකර ඇත. කාර්මික නිලධාරී තනතුර සඳහා ස්ථිරව බඳවාගැනීමේ තරග විභාගය 2022 මැයි 22 පැවැත්වීමට කටයුතු කර ඇත. ඉදිරියේ දී ඉතිරි පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමේ හැකියාව පවතී. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් ඉංජිනේරු (සිවිල්) තනතුර සඳහා නිලධාරීන් 15 ක් අනුමත කර ඇති නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට නිලධාරීන් 10 ක් පමණක් බඳවාගෙන තිබූ අතර, ඉතිරි නිලධාරී පුරප්පාඩු 05 සම්පූර්ණ කර ගැනීමෙන් තොරව එක් නිලධාරියෙකුට දිස්ත්‍රික්ක කිහිපයක අධීක්ෂණ කටයුතු පවරා තිබූ බව නිරීක්ෂණය විය. තව ද, කාර්මික නිලධාරී තනතුර සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු 40 ක් අනුමත කර තිබුණ ද, එක් නිලධාරියෙකු හෝ ස්ථිර පදනමින් බඳවාගැනීමෙන් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 26 ක් බඳවාගැනීමට කටයුතු කර තිබූ බව නිරීක්ෂණය විය. | කාර්මික නිලධාරීන් 26 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති අතර ඉදිරියේ දී ස්ථිර පදනමින් බඳවාගැනීමට අදාල කටයුතු සිදුකර ඇත. | - එම - |
| (ඇ) | දිස්ත්‍රික් කාර්යාලවලට අනුයුක්ත කර ඇති ස්ථාන භාර නිලධාරී, සංවර්ධන නිලධාරී යන තනතුරු දරන නිලධාරීන් සඳහා රාජකාරී ලැයිස්තුවක් මගින් රාජකාරී පවරා නොමැති බව කළුතර දිස්ත්‍රික් ප්‍රාදේශීය කාර්යාලයේ සිදුකළ ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය. | සියළුම ස්ථානභාර නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සඳහා විධිමත්ව රාජකාරී ලැයිස්තුවක් ලබා දී ඇත. | රාජකාරී ලැයිස්තුවක් මගින් සියළුම නිලධාරීන්ට විධිමත් ලෙස රාජකාරී පැවරිය යුතු වීම. |